WWW.WSWS.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය


# කොළඹ නගරය සුපිරි ධනපතියන්ගේ පාරාදීසයක් බවට පත්වෙයි

ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි

2017 මාර්තු 12

කොළඹ නගරයේ සුපිරි ධනවතුන් සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වෙමින් තිබෙන බව එක්සත් රාජධානිය පදනම් කරගත් නයිට් ෆ්‍රෑන්ක් (Knight Frank) නම් වූ ගෝලීය දේපොල උපදේශන සේවය විසින් නිකුත් කරන ලද 2016 වත්කම් වාර්තාවේ දැක්වේ. වාර්තාවට අනුව, කොළඹ නගරය තුල සුපිරි ධනවතුන් හෙවත් ඩොලර් මිලියන 30 ට (රුපියල් බිලියන 45) වැඩි පුද්ගලික වත්කම් සහිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව ඉදිරි දසකය තුල 70 සිට 182 දක්වා සියයට 160 කින් ඉහල යනු ඇත.

2016 දී ඩොලර් මිලියනපතියන් 3,400 ක් ද ඩොලර් මිලියන 10 වැඩි බහු මිලියනපතියන් 170 ක් ද ඩොලර් මිලියන 30 වැඩි ඉතා ඉහල ශුද්ධ වත්කම් සහිත සුපිරි ධනවතුන් 70 ක් ද කොළඹ නගරය තුල සිටි බව වාර්තාව කියයි. කොළඹ නගරය තුල සුපිරි ධනවතුන්ගේ වර්ධනය දෙවැනි වන්නේ ගෝලීයව සිදුවන මෙම වර්ධනයේ පලමු තැන සිටින වියට්නාමයේ හෝචිමින් නගරයට පමනි. 2016 දී හෝචිමින් නගරයේ සුපිරි ධනවතුන්ගේ සංඛ්‍යාව 90 කි. එය 2026 වනවිට 243 දක්වා සියයට 170 කින් ඉහල යනු ඇතැයි ගනන් බලා ඇත.

කොළඹ නගරය තුල සුපිරි ධනවතුන්ගේ සංකේන්ද්‍රනය ඉහල යමින් පවතින්නේ රටේ ජනතාවගෙන් සියයට 40 ක් පමන දිනකට රුපියල් 225 වඩා අඩු, එනම් ඩොලර් 2 අඩු, ආදායමක් ලබමින් දරිද්‍රතාවයේ ගිලී සිටින අතරතුර හා තරුන ජනයා අතර විරැකියාව සියයට 20 ඉක්මවා ඇති තත්වයක් තුල ය. කොළඹ නගරය තුල බහුතර ජනගහනයකට සුදුසු නිවාස, සෞඛ්‍යය සහ අධ්‍යාපනය ඇතුලු මූලික පහසුකම් පවා නැත.

කොළඹ නගරය තුල පදිංචි සුපිරි ධනපතියන් අතරින් දේශීය ධනපතියන් සංඛ්‍යාව ගැන වාර්තාවේ වෙන ම සඳහනක් නැතත් මූල්‍ය මගඩි හා රාජ්‍ය ධනය යටි මඩි ගැසූ දේශපාලකයන් හා ව්‍යාපාරිකයන් අතර සුපිරි ධනපතියන් නොහිටිනවා විය නොහැකිය.

හෝචිමින් සහ කොළඹ නගර තුල සුපිරි ධනපතියන්ගේ වර්ධනය සංඛ්‍යාවෙන් සාපේක්ෂව කුඩා නමුත් එය ගෝලීය ප්‍රපංචයක් හා බැඳුනු වර්ධනයකි. 2005 සිට 2016 දක්වා සුපිරි ධනවතුන්ගේ ගෝලීය ජනගහනය 6,343 සිට 193,490 දක්වා ඉහල නැගුන බව වාර්තාව පෙන්වා දෙයි. මෙම කාල පරාසය තුල ඩොලර් බිලියනපතියන්ගේ සංඛ්‍යාවට 60 ක් අලුතෙන් එකතුවීමෙන් මුලු ජනගහනය 2,024 දක්වා ඉහල ගොස් ඇත. එය සියයට 45 ක වැඩි වීමකි.

ඉදිරි දස වසර තුල ආසියාවේ සෙසු නගර කිහිපයක සුපිරි ධනවතුන්ගේ වර්ධනය සැලකුවහොත්, ඉන්දියාවේ හයිද්‍රාබාද් වල සුපිරි ධනවතුන්ගේ සංඛ්‍යාව සියයට 160 කින් ද, චීනයේ ෂැන්හයි ශෙන්ෂෙන් වල සියයට 150 කින් ද හොන් කොන්ග් සහ සිංගප්පූරුවේ සියයට 40 කින් ද ඉහල යනු ඇත. කොළඹ සහ හෝචිමින් නගර තුල මෙන් ම මෙම නගරවල අති මහත් බහුතර ජනයා ගැඹුරු වන සමාජ අසමානතාවය, දරිද්‍රතාවය හා විරැකියාවට මුහුන දී සිටිති.

මෙම ධන කුවේරයන්ගේ පුද්ගල වත්කම් ගනන් බැලීමේ දී ඒ සඳහා මිනුම් දඬුව ලෙස යොදා ගෙන ඇත්තේ එකී පුද්ගලයන් සතු ද්‍රවශීලතා වත්කම් ලෙස සැලකෙන ඉඩම්, නිවාස සහ කොටස් වෙළඳපල වත්කම් ය.

2008 පුපුරා ගිය ලෝක ආර්ථික අවපාතයත් සමග ධනය ගොඩගසා ගැනීම ප්‍රධාන කොට ම සිදුවන්නේ, නිෂ්පාදන කර්මාන්ත වල ආයෝජන වෙනුවට මූල්‍ය සමපේක්ෂන, කොටස් වෙළඳපලේ සූදු කෙලීම හා කැසිනෝ ඇතුලු වෙනත් මූල්‍ය මගඩි මගින් අසීමිත ලෙස ලාභ ඉපැයීම මගිනි.

අතලොස්සක් අතේ ලෝක වත්කම් වලින් වැඩි පදාසයක් ගොඩ ගැසෙන අතර ලෝක ජනගහනයෙන් බහුතරය වඩවඩාත් දරිද්‍රතාවයේ ගිලෙමින් සිටිති. 2016 ඔක්ස්ෆාම් වාර්තාවට අනුව ලෝක ජනගහනයෙන් හරි අඩකට වැඩි ජනයාගේ වත්කම්වලට සමාන වත්කමක් බිලියනපති මහා ධනකුවේරයන් 8 දෙනෙකු අත ගොනු වී ඇත.

ශ්‍රී ලංකාව තුල සුපිරි ධනවතුන්ගේ සංඛ්‍යාව ඉහලයාම සිදු වූයේ පසුගිය දසකය තුල, විශේෂයෙන් ම, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට විරුද්ධ යුද්ධය 2009 දී අවසන්වීමෙන් පසු මහින්ද රාජපක්ෂ ආන්ඩුව සහ වර්තමාන ආන්ඩුව විසින් විදේශ ආයෝජන ආකර්ෂනය කර ගැනීම සඳහා ක්‍රියාවට දැමුනු ඊනියා සංවර්ධන සැලසුම් යටතේ ය.

කොලඹ නගරය ආසියාවේ වානිජ මධ්‍යස්ථානය බවට පත් කිරීමේ සැලසුම් රාජපක්ෂ ආන්ඩුව යටතේ ආරම්භ කෙරුන අතර වර්තමාන ආන්ඩුව යටතේ එය වේගවත් කෙරී ඇත. මෙම සැලැස්මට ම අනුබද්ධිතව කොලඹ, ගම්පහ සහ කලුතර දිස්ත්‍රික්ක යා කෙරුන මෙගා (මහා) නගර සැලැස්මක් ක්‍රියාවට දැමීම ආරම්භ කර තිබේ.

ඒ යටතේ මහා ධනකුවේරයන් සඳහා සියලු පහසුකම් සහිත අධිසුඛෝපභෝගී මහල් නිවාස හා යටිතල පහසුකම් සම්පාදනය කෙරෙයි. ඒ සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කර ගැනීම පිනිස කොලඹ නගර සීමාව තුල පමනක් 70,000 වැඩි දුගී පවුල් සංඛ්‍යාවක් එනම් මිලියන භාගයක් පමන ජනයා ඉවත් කිරීමට නියමිත ය. දැනටමත් පවුල් කිහිප දහසක් ඔවුන් පදිංචිව සිටි ස්ථාන වලින් බලහත්කාරයෙන් ඉවත් කර ප්‍රමානවත් පහසුකම් නැති කුඩා මහල් නිවාසවලට ගාල් කරනු ලැබ සිටිති.

මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආන්ඩුවේ ඊනියා තිරසර සංවර්ධන සැලැස්ම යටතේ අවුරුදු තුනක් තුල මෙම ක්‍රියාවලිය සම්පූර්න කිරීමට අපේක්ෂා කරන බව පැවසෙයි. ඒ සඳහා අවශ්‍ය නීති යෝජිත ආර්ථික සංවර්ධන විශේෂ විධිවිධාන පනත මගින් සම්පාදනය කෙරෙයි.

බහුතර ජනයා වඩ වඩා දුෂ්කර සමාජ කොන්දේසිවලට ඇද දමන තතු තුල කොලඹ නගරය තුල සුපිරි ධනපතියන් ගේ සංකේන්ද්‍රනයවීම මගින් ධනපති ආන්ඩුව ඔජවඩවන ඊනියා සංවර්ධනයේ සැබෑ ස්වරූපය එළිදරව් වී ඇත.

© www.wsws.org